**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය - 2022**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ("ශ්‍රී ලංකා ක්‍රිකට්") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2. මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.5.1 ලැබිය යුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ---------------------------------------- | ----------------- |
| (අ) | 2018 වර්ෂයේ දී ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය සහ 2020 වර්ෂයේ දී මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම වෙනුවෙන් පුද්ගලික ඉදිකිරීම් ආයතනයන දෙකක් වෙත පිළිවෙලින් රු.මිලියන 9 ක සහ රු.මිලියන 11.9 ක අත්තිකාරම් ලබා දී තිබුණද, මෙම අත්තිකාරම් නිරවුල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම,2020 වර්ෂයේ මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සමාලෝචිත වර්ෂයයේ දී අවසන් කර තිබුණද ඒ වෙනුවෙන් 2020 වර්ෂයේ දී පුද්ගලික ආයතනයක් වෙත ලබා දී මෙතෙක් අය නොවූ රු.මිලියන 11.9 ක අත්තිකාරම් ශේෂය ද නිරවුල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතීන් වලට අදාල ඉදිකිරීම් කටයුතු අවසන් කොට තිබුණද මේ සඳහා අදාල ලිපිලේඛන සම්පූර්ණ කිරීමේ කාර්යයන්හි වැඩ කටයුතු අවසන් නොවීම හේතුවෙන් මෙම ශේෂයන්ට අදාලව කලයුතු ගිණුම් ගැලපීම් සිදුකර ගැනීමට නොහැකි වූ අතර එම කටයුතු අවසන් වූ විගස මෙම ශේෂයන්ට අදාල ගැලපීම් කිරීමට පියවර ගන්නා බවට දැනුම් දෙමු. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට සහ ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් මොණරාගල ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ටර්ෆ් විකට් (Turf Wicket) 07 ක් ඉදිකිරීම සඳහා 2021 වර්ෂයේ දී ලබා දී තිබූ අත්තිකාරම් මුදලින් රු.මිලියන 5.6 ක් සහ විද්‍යාර්ථ විද්‍යාලයේ ක්‍රීඩාංගනය ඉදිකිරීම වෙනුවෙන් 2021 වර්ෂයේ දී ලබා | මොණරාගල ක්‍රිකට් ක්‍රීඩාංගනයේ සහ විද්‍යාර්ථ විද්‍යාලයේ ක්‍රීඩාංගණයේ ඉදිකිරීමේ කටයුතු මේ වනවිට අවසන් කොට තිබුණද, අදාල ලිපිලේඛණ සම්පූර්ණ කිරීමේ වැඩ කටයුතු අවසන් වූ විගස මෙම ශේෂයන් වලට අදාල ගිණුම් ගැලපීම් සිදු කිරීමට පියවර ගන්නා බවට දැනුම් දෙමු. | අත්තිකාරම් අප්‍රමාදව නිරවුල් කරවා ගැනීම හා අවශ්‍ය ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කිරීම. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | දී තිබූ අත්තිකාරම් මුදලින් රු.මිලියන 6.6 ක් වශයෙන් එකතුව රු.මිලියන 12.2 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කරවා ගෙන නොතිබුණි. | | |
| (ඇ) | 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා දකුණු අප්‍රිකානු සංචාරය වෙනුවෙන් ලැබිය යුතු අනුග්‍රාහකත්ව හිමිකම් ආදායම වූ රු.මිලියන 37.1 ක් ලැබිය යුතු බවට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද මේ සම්බන්ධයෙන් ආයතනය 2018 ඔක්තෝබර් 04 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කරන ලද පැමිණිල්ල ප්‍රකාර අධිකරණමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පැවතුණි. | මෙම මුදල වාර්තාකරන දිනය වනවිට මෙය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලැබී නොතිබුණි. කෙසේවෙතත්, සැපයුම්කරු විසින් එම මුදල ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ගෙවා ඇති බව ප්‍රකාශ කර ඇත. මේ පිළිබඳ පරීක්ෂණයක් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ (නඩු අංක බී/657/01/18 නඩුව) විභාග වෙමින් පවතින අතර, මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනය වන විටත් එය අවසන් කර නොමැත. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ගෙවිය යුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නොගෙවා තිබූ රු.මිලියන 5 ක ශේෂයක් පැවතුණි. | ආපසු ගෙවිය යුතු ණයහිමි ශේෂය රු.5,120,380 කට අදාල සියළු ලියකියවිලි අනුමැතීන් ඇතිව ලැබුනු පසු අදාල ගැලපුම් සිදුකොට මෙම ශේෂයට අදාල ගැලපීම් කිරීමට අවශ්‍ය කටයුතු 2023 වර්ෂය තුලදී සම්පාදනය කරනු ලැබේ. | **ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.** |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 6,048 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 2,479 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 3,569 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආදායම රු. මිලියන 9,586 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොළොන්නරුව හිඟුරක්ගොඩ ප්‍රදේශයේ ජාත්‍යන්තර | මෙම කටයුත්ත ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල නමුත් ඊට අදාල සේවා | කොන්ත්‍රාත් පරිපාලනය නිසිපරිදි සිදුකර |

| | | | |
|---|---|---|---|
| | තත්ත්වයට දියුණු කල හැකි පරිදි ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් සහ බහු ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018 ඔක්තෝබර් මස නිම කිරීමට සැලසුම් කර 2017 අගෝස්තු 17 දින ආරම්භ කර ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 154 ක් වැයකර තිබුණද අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ දක්වා අපොහොසත් වී තිබුණි. | සපයන අනෙකුත් රාජ්‍ය ආයතන වලින් බලාපොරොත්තු වූ ආකාරයේ කඩිනම් සේවාවක් නොලැබීම හේතුවෙන් මෙම ඉඩමට අදාල බදු ඔප්පුව සකස් කරගැනීම ප්‍රමාද වී ඇත. | අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට **කටයුතු කළ යුතුය.** |
| (ආ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ඉල්ලීම පරිදි කිලිනොච්චිය ක්‍රිකට් ක්‍රීඩා පිටියෙහි ඉතිරි වැඩ නිම කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2018 වර්ෂයේ දී රු.මිලියන 10 ක් යුධ හමුදා ව්‍යාපෘති ගිණුමට බැර කර තිබුණද එම මුදලින් පළාතේ ක්‍රීඩකයන්ට හා ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවන්නන්හට ප්‍රතිලාභ අත්කර දීමේ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් වී තිබුණි. | අමාත්‍යාංශයේ ඉල්ලීමට ගරු කිරීමක් වශයෙන්, විධායක කමිටුවේ අනුමැතියද ඇතිව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් රු.මිලියන 10 ක් ශ්‍රී ලංකා යුධ හමුදා ව්‍යාපෘති ගිණුමට බැර කරන ලදී. මෙහි ඉදිරි වැඩකටයුතු කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන වලින් අදාල සේවාවන් ඉතා මන්දගාමීව සිදු කල හෙයින් ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු නිම කර ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇති බව කාරුණිකව දන්වා සිටිමු. | ආයතනයේ අරමුදල් මුල්‍යනය කිරීමේදී අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි පාලක මණ්ඩලයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | දකුණු පළාත් ක්‍රිකට් සංගමයේ ව්‍යවස්ථාව ප්‍රකාරව, එහි නිලධාරින් විසින් මහා සභා රැස්වීම වාර්ෂිකව හා නිලවරණය වර්ෂ 3 කට වරක්ද පවත්වා නොතිබුණද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.මිලියන 84 ක් දකුණු පළාත් ක්‍රිකට් සංගමය වෙත පරිපාලන කටයුතු, ක්‍රීඩා තරඟ හා ක්‍රීඩා සංවර්ධන කටයුතු සඳහා ගෙවා තිබුණි. | 2006 සිට 2016 දක්වා දකුණු පළාත් ක්‍රීඩා සංගමයට මුදල් ගෙවීම සඳහා අදාල කාලසීමාව තුල විගණනය කරන ලද මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බවට මෙයින් දන්වා සිටිමු. | ක්‍රිකට් සංගම් විසින් ව්‍යවස්ථාපිත අවශ්‍යතා ඉටු කිරීම පිළිබඳව ආයතනයේ කළමණාකරනය අවධානය යොමු කළ යුතුය. |
| (ඈ) | 2015 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර පසුව අතරමග නවතා දමා තිබූ කළ වැඩ වටිනාකම රු.මිලියන 29 ක් වූ ව්‍යාපෘතියක් | රු.මිලියන 29 ක ගෙවීම් කර ඇත්තේ නිදහස් කුළුණ ව්‍යාපෘතිය සඳහා නොවන බව දන්වා සිටිමු. රු.මිලියන 11 ක මුදල අදාල වනුයේ නිදහස් කුළුණ ඉදිකිරීම | අපේක්ෂිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට හා ආයෝජන මුදලින් අපේක්ෂිත ප්‍රතිලාභ |

| | | | |
|---|---|---|---|
| | නැවත ඉදිකිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් 2018 හා 2019 වර්ෂ වලදී උපදේශන සමාගම් වෙත ගෙවා තිබූ රු.මිලියන 11 ක් කෙරීගෙන යන වැඩ ශේෂය තුළ ඇතුළත්ව තිබුණි. මෙම ව්‍යාපෘතිය නිම කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් කළමනාකරණයේ නිසි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වැය කර තිබූ මුදල නිශ්කාර්ය පිරිවැයක් බවට පත් වී තිබුණි. | සඳහා වන අතර මෙය කෙරීගෙන යන වැඩසටහනකි.<br>මේ සම්බන්ධයෙන් දැනටමත් කාර්යයන් සිදු කරගෙන යන බව දන්වා සිටිමු. | අප්‍රමාදව ලබා ගැනීමට කළමණාකරනය අවධානය යොමු කළ යුතුය. |
| (ඉ) | පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පිහිණුම් තටාකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ප්‍රදානය 2019 නොවැම්බර් 20 දින සිදු කර ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 04 ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 147 ක් වැයකර තිබුණද ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අවසන් කර නොතිබුණි. | රට තුල උද්ගතව තිබු covid 19 වසංගත තත්වයත් ඉන්පසුව ඇති වූ ආර්ථික අර්බුදයත් හේතු කොට ගෙන මෙම ව්‍යාපෘතිය නියමිත දිනට අවසන් කොට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත භාර දීමට අදාල කොන්ත්‍රාත්කරුට නොහැකි වී ඇත. මෙම ව්‍යාපෘතිය අවසන් අදියරේ පසුවන බැවින් 2023 වසර තුලදී මෙය නිම කිරීමට කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි සිදුකර ඉදිකිරීම් කටයුතු අප්‍රමාදව නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කෙරීගෙන යන වැඩ යටතේ ඉදිකිරීම් වැඩ අවසන් කළ යුතු දිනයක් සඳහන් නොකර රු.මිලියන 37 ක් වූ රංගිරි දඹුලු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ යෝජිත පිහිණුම් තටාකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019 නොවැම්බර් 20 දින ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. | රට තුල උද්ගතව තිබු covid 19 වසංගත තත්වයත් ඉන් පසුව ඇති වූ ආර්ථික අර්බුදයත් හේතු කොට ගෙන මෙම ව්‍යාපෘතිය නියමිත දිනට අවසන් කොට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත භාර දීමට අදාල කොන්ත්‍රාත්කරුට නොහැකි වී ඇත.. මෙම ව්‍යාපෘතිය අවසන් අදියරේ පසුවන බැවින් 2023 වසර තුලදී මෙය නිම කිරීමට කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි සිදුකර ඉදිකිරීම් කටයුතු අප්‍රමාදව නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ රු.මිලියන 38 ක් වටිනා මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ නවීකරණ ව්‍යාපෘතියට ඇතුලත් විදුලි අලි වැටක් සහ මාධ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේ ආරම්භ කර එම වර්ෂයේදීම අවසන් විය යුතුව තිබුණද මෙම කොන්ත්‍රාත් දෙකෙහි වැඩ සමාලෝචිත වර්ෂය | රට තුල උද්ගතව තිබු covid 19 වසංගත තත්වයත් ඉන් පසුව ඇති වූ ආර්ථික අර්බුදයත් හේතු කොට ගෙන මෙම අලි වැට ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2020 නොවැම්බර් මස 27 වන දිනද, මාධ්‍ය ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය 2020 නොවැම්බර් මස 01 වන දිනද අවසන් කොට තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතීන් ප්‍රාග්ධනිත කිරීමට අදාල ලියකියවිලි සම්පූර්ණ නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතීන් කෙරීගෙන | කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි සිදුකර නිමවු ව්‍යාපෘති ප්‍රාග්ධනිත කිරීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවසන් වන විටත් නිම කර නොතිබුණි. | යන ව්‍යාපෘතින් ලෙස නම් කොට ඇත. මීට අමතරව, මෙම ලියකියවිලි සම්පූර්ණ වූ විගස අප විසින් මෙම ව්‍යාපෘතීන් ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය පියවර ගැනීමට බලාපොරොත්තු වෙමු. | |
| (ඖ) | 2014 සහ 2015 වර්ෂ වල ආරම්භ කර රු.මිලියන 47 ක් ගෙවා තිබූ පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ගෘහස්ථ දැල් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම,රංගිරි දඹුලු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ගෘහස්ථ දැල් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම, ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පිහිනුම් තටාකයක් සහ ගෘහස්ථ දැල් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම යන ව්‍යාපෘති 04 හි ඉදිකිරීම් හා උපදේශන කොන්ත්‍රාත්කරු වූ මධ්‍යම ඉංජිනේරු කාර්යාංශට අදාළ පළාත් පාලන ආයතන වලින් සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් අත්හැර දමා තිබුණ නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ද කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | මේ සඳහා අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ක්‍රීඩා අමාත්‍යාංශයේ නිර්දේශයන් ලබාගැනීම සඳහා විධායක සභාවට යොමුකර ඇත. නිසි ගිනුම්කරණ ගැලපීම් කිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය ලැබෙන තෙක් ගිණුම්වල කෙරීගෙන යන වැඩ ලෙස ඇතුලත් කර ඇත. | ව්‍යාපෘති කළමණාකරනය කාර්යක්ෂමව සිදු කළ යුතු වන අතර ආයතනයේ අරමුදල් අකාර්යක්ෂමව යෙදවීම් පිළිබඳව වගකිවයුතු පාර්ශ්වයන් හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් කළමණාකරනය විධිමත් පරිදි කටයුතු කළ යුතුය. |

**3.3 තොග පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ---------------------------------------- | ----------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ ඉන්වෙන්ට්‍රි තොගය තුළ මැත වර්ෂ 04 ක් තුළ චලනය නොවෙමින් පවතින රු.මිලියන 7 ක පිරිවැයක් සහිත ක්‍රීඩා උපකරණ තොගයක් පැවතුණි. | අවසන් තොගය තුල රු.7,066,951 ක පිරිවැයක් සහිත තොගයක් පැවති අතර එම තොගය වසර 4 ක කාලයක් තුල චලනය නොවූ තොග බව අප සංගමය මීට පෙර හඳුනා ගෙන තිබුණි. ඉදිරියේදී තරඟ පවත් වනවිට FIFO තොග සංකල්පය යටතේ නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවට මින් දන්වා සිටිමු. | ආයතනයේ තොග අවශ්‍යතාවය අනුව තොග රැස්කිරීම හා අභ්‍යන්තර පාලනය විධිමත්ව සිදු කළ යුතුය. |